**ශීර්ෂය 251 - තක්සේරු දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------------**

ශීර්ෂය 251 - තක්සේරු දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තක්සේරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට තක්සේරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-------------------------------------------

**1.6.1 වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන්ට අදාල ආදායම් රැස්කිරීම**

----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 7.2 ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරින් වෙනුවෙන් එකතු කරන ලද රු.119,601,489 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුළ ගැලැපිය යුතුව තිබුණි. නමුත් එම වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් වශයෙන් දක්වා තිබුණි. මේ නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.119,601,489 කින් වැඩියෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය සමග එකග වේ. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු විම. |

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 30 දිනැති අංක **SA/MAA/**02/01/01 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව **ACA – 6** ආකෘතිය සංශෝධනය කර එම ආකෘතියේ **CIGAS** වෙබ් යෙදුම මඟින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව එම ආකෘතියේ අමුණන ලෙස උපදෙස් ලබා දී තිබුණත්**,** විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල එසේ සිදු කර නොතිබුණි. | අතපසු වීමකින් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ **SA** 82 වාර්තාව ගිණුමට අමුණා නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී රු.29,078,410 ක් වැයකර පරිගණක උපකරණ මිලදී ගෙන තිබුණි. භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත **SA** 82 හි එම වත්කම්වල වටිනාකම රු.25,463,960 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව රු.3,614,450 ක වත්කම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | සිගාස් වැඩසටහනෙහි **BOS** වාර්තාව හා ලෙජරය අතර වෙනසක් නොමැති අතර**,** මෙම වෙනසට හේතුව සිගාස් මෘදුකාංගය මගින් සෑම මසකම අවසානයේදී මූල්‍ය නොවන වත්කම් භාණ්ඩාගාරය වෙත උඩුගත කළද**,** එම වත්කම් පරිගණක දෝෂයක් හේතුවෙන් භාණ්ඩාගාරයේ ගිණුම්ගත වී නොමැති වීමයි. මේ සම්බන්ධයෙන් කීප වරකදීම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කළ අතර මෙම වර්ෂයේදී එම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මිල දී ගන්නා වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 ජූලි මාසයේ දී දෙපාර්තමේන්තුවේ වාහනයක් අපහරණය කර තිබුණු නමුත් මූල්‍ය නොවන වත්කම්වල එම වාහනයේ වටිනාකම අපහරණය යටතේ සඳහන් කර නොතිබුණි. මෝටර් රථය විකිණීම සඳහා ප්‍රසිද්ධ මිල ගණන් කැඳවා තිබුණු අතර ඒ සඳහා ලංසු 03 ක් ලැබී තිබුණි. එම ලංසු අතරින් වැඩිම ලංසු වටිනාකම සඳහන් කර තිබුණු ලංසුකරුවන් දෙදෙනා මෝටර් රථය මිල දී ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව රු.1,958,980 ක අවම ලංසු වටිනාකම ඉදිරිපත් කර තිබුණු ලංසුකරුට එම වාහනය පවරා දී තිබුණි. | විකිණීමට තීරණය කළ දිනට තක්සේරු වටිනාකම රු.1,050,000.00 වන අතර මෝටර් රථය විකිණීම සඳහා ප්‍රසිද්ධ මිළ ගණන් කැඳවා ඒ සඳහා ලැබී තිබූ මිළ ගණන් අතරින් මුල් ඉල්ලුම්කරුවන් දෙදෙනා මෝටර් රථය මිළදී ගැනීමට නොහැකි බව ලිඛිතව දන්වා ඇත. එබැවින් තුන්වන වැඩිම මිළට ඉල්ලුම් කළ වටිනාකමට මෝටර් රථය පවරා දී ඇත. | අපහරණ වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |

## 1.6.3 තැන්පතු ගිණුමේ ශේෂය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.4,107,308 ක් වී තිබුණි. එම ශේෂයෙන් එකතුව රු.622,517 ක තැන්පත් ශේෂ වර්ෂ දෙකකට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණත්, එම කල් ඉකුත් වූ තැන්පතු ශේෂවලින් තවදුරටත් රු.308,179ක් සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමෙන් අනතුරුව රු.312,400 ක් 2022 මාර්තු හා අප්‍රේල් මාසවලදී ගෙවීම් කර රු.1,938 ක් රාජ්‍ය ආදායමට බැර කර ඇත. අනෙකුත් තැන්පතු සම්බන්ධයෙන් සිහිකැඳවීම් යවා ඇති අතර, ඒ සඳහා ලැබෙන ප්‍රතිචාරයට අනුව නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) 2020 හා 2021 වර්ෂවල පිළිවෙලින් රු.1,935,608ක් හා රු.395,667ක තක්සේරු ආදායම්, ආදායම් වශයෙන් ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ආදායම් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | දෙපාර්තමේන්තු බැංකු ගිණුමට සෘජු වශයෙන් තැන්පත් කර ඇතත් මෙම තැන්පතුවට අදාළ තොරතුරු නොමැති වීම හේතුවෙන් තැන්පත් ගිණුමට මාරු කර ඇත. තැන්පත්කරු හඳුනා ගැනීමෙන් පසු තක්සේරු ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | දෙපාර්තමේන්තුවේ ආදායම් අප්‍රමාදව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වීම. |

## 1.6.4 වෙනත් ආයතන විසින් දරන ලද වියදම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වෙනත් ආයතන විසින් දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ රු.5,340,931 ක් වැය කර තිබුණු අතර, එම වියදම අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ රු.5,343,789 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.2,858 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අඩුවෙන් දක්වා තිබුණි. | මෙම රු.2,858 ක මුදල භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම ගිණුම්ගත කිරීමේදී වැඩිපුර ගිණුම්ගත කිරීමක් නිවැරදි කිරීම සඳහා යොදන ලද සටහනකි. එම මුදල අග්‍රිමය සටහන් කිරීමේදී නිවැරදි කර ඇත. ඒ අනුව වෙනත් දෙපාර්තමේන්තු මගින් දරන ලද වියදම රු.5,343,789 වශයෙන් සඳහන් කිරීම නිවැරදි වේ. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී නිවැරදි වටිනාකම් ඇතුළත් කර ඉදිරිපත් කළ යුතු වීම. |

**1.6.5 අග්‍රිම ගැලැපුම් ශේෂය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.6,526,337 ක් වී තිබුණි. සංශෝධිත **ACA – 7** ආකෘතියේ සඳහන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ශේෂය රු.6,526,337ක් වී තිබුණි. එම ශේෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අග්‍රිම ශේෂය සමඟ ගැලැපූ විට රු.13,052,674 ක් වේ. නමුත් අග්‍රිම ගැලපුම් ශේෂය ඍණ (-) රු.6,526,337 ක් විය යුතුව තිබුණත් එය සංශෝධිත **ACA** 7 ආකෘතිය නිවැරදි ලෙස ඉදිරිපත් නොකර තිබීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා ඇති සටහන් අනුව අග්‍රිම ගිණුමේ ශේෂය ශුන්‍ය අගයක් ලෙස තාර්කික ලෙස ඉදිරිපත් වි නොතිබුණි. | මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශයට අනුව (**ACA** 7) සියලු ආදායම් වියදම් ගැලපීමෙන් පසු 2021.12.31 දිනට ශේෂය රු.6,526,337 ක් ලෙස පෙන්නුම් කරන අතර, අග්‍රිම ගැලපුම් ගිණුමේ ශේෂය වන රු.6,526,337 ක මුදල අඩු කිරීමෙන් පසු ශුන්‍ය අගයක් වී ඇත. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ සඳහන් උපදෙස් අනුව සංඛ්‍යා තාර්කික ලෙස ඉදිරිපත් කළ යුතුවිම. |

**1.6.6 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වෙනත් වැය ශීර්ෂයන් වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.9,362,692 ක් වැය කර තිබුණත්, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වැය | ඍජු ක්‍රමය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී හරස් සටහනද ඇතුළත් කළ යුතු බැවින් වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් හරස් සටහන් මගින් අත්තිතාරම් බී | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයේ 7.6 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු විම. |

| | | | |
|---|---|---|---|
| | කිරීම් ලෙස රු.18,751,392 ක් දක්වා තිබුණි. ඒ අනුව රු.9,388,700 ක් වැඩිපුර දක්වා තිබුණි. | ගිණුමට සටහන් කරන ලද රු.229,903/- ක් සහ දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙනත් දෙපාර්තමේන්තු විසින් ගිණුම්ගත කරන ලද රු.9,158,796 ක් ද මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වැයකිරීම් ලෙස දක්වා ඇත. | |
| (ආ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 7.6 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් හා හරස් සටහන් යන දෙකම සැලැකිල්ලට ගෙන සෘජු ක්‍රමය භාවිතා කරමින් පිළියෙල කළ යුතුව තිබුණි. ඒ අනුව අත්තිකාරම් ලැබීම් රු.31,861,642 ක්ද, අත්තිකාරම් ගෙවීම් රු.36,353,927 ක්ද වශයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුව තිබුණි. නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පිළිවෙලින් රු.34,139,173 ක් හා රු.36,124,024 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් රු.2,277,531 කින් හා අත්තිකාරම් ගෙවීම් රු.229,903 ක් අඩුවෙන්ද දක්වා තිබුණි. | අත්තිකාරම් සම්බන්ධ ගනුදෙනු වල සාරාංශය **SA** – 52 භාණ්ඩාගාර මුද්‍රිතය අනුව අත්තිකාරම් ලැබීම් රු.34,139,173ක් ද**,** අත්තිකාරම් ගෙවීම් රු.36,124,024ක් ද වේ. | එම |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් රු.119,601,489 ක් රැස්කර තිබුණත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.12,225,054 ක් ලෙස රු.107,376,435 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ සමග එකග වේ. මෙම මුදල ආදායම් නොවන ලැබීම් ශීර්ෂය යටතේ දක්වා ඇති බැවින් සමස්ථ ප්‍රතිඵලය නිවැරදි ලෙස පෙන්නුම් කරනු ලබන බව කාරුණිකව දන්වමි. | එම |
| (ඇ) | ආදායම් නොවන වර්ගීකරණය යටතේ දෙපාර්තමේන්තුවේ ලැබීම් කිසිවක් අනාවරණය වී නොතිබුණත්, එම වර්ගීකරණය යටතේ රු.119,601,489 ක් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ සමග එකග වේ. වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් එකතු කරන ලද මුදල අතපසුවීමකින් ආදායම් නොවන ලැබීම් ලෙස දක්වා ඇතත් සමස්ථ ප්‍රතිඵලය නිවැරදි ලෙස පෙන්නුම් කරනු ලබන බව කාරුණිකව දන්වමි. | එම |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව 20.03.02.09 ආදායම් සංකේතය යටතේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ආදායම ලෙස රු.90,000,000 ක් දක්වා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් මු.රෙ. 85(2)(අ) ප්‍රකාරව කටයුතු නොකර ආදායම් | 2021 වර්ෂයේ මුල් මාස කිහිපයේදී වැඩි කාලයක් කාර්යාල වසා තැබීම හෝ සීමිත පිරිසක් යොදවා කාර්යාල කටයුතු සිදුකිරීමට සිදුවීම හේතුවෙන් ලිපි ලේඛන කටයුතු නිසි පරිදි සිදු වී නොමැති වුවද මුල් මාස කිහිපයේ සත්‍ය ආදායම වියදම් කරගෙන වර්ෂය සඳහා | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව හා තාර්කික ලෙස පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුව රු.82,000,000 ක් ලෙස සංශෝධන කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ දී තක්සේරු දෙපාර්තමේන්තුවේ ආදායම ලෙස රු.107,658,875 ක් රැස්කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේදි රැස්කළ යුතු ආදායම නිවැරදි ලෙස පුරෝකථනය නොකිරීම නිසා මු.රෙ. 85(2)(අ) ප්‍රකාරව නිවැරදි ලෙස ආදායම් ඇස්තමේන්තුව පිළියෙල කර නොතිබුණි. | වන ආදායම් ඇස්තමේන්තුව ඒ අනුව සංශෝධනය කර ගන්නා ලදී.එසේ වුවද 2021 වර්ෂයේ අවසන් මාස කිහිපය සාමාන්‍ය තත්ත්වයන් යටතේ කටයුතු කිරීමට හැකිවීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රමාණයන්ට වඩා වැඩි ආදායමක් රැස් කිරීමට හැකියාවක් ලැබුණි. | |
| (ආ) | මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව ආදායම් සම්බන්ධව මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි. | මු.රෙ. 135 යටතේ බලතල පැවරීමේදී ආදායම සම්බන්ධයෙන් බලතල ඇතුළත් කිරීමට සටහන් කර ගන්නා ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2015 ජුලි 22 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 3 වන ඡේදය ප්‍රකාරව ආදායම් ගණනය කිරීමේ පදනම සඳහන් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයට අනුව ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් කරමින් ඇස්තමේන්තු සකස් කිරීමට උපදෙස් දුනිමි. | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු. 692,250,571 ක හිඟ තක්සේරු ගාස්තු ආදායමෙන් රු.459,388,974 ක් හෙවත් සියයට 66 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 13 ක් අතර කාල පරාසයක් තුළ හිඟව පැවැතුණි. | රට තුළ පැවති කොවිඩ් වසංගත ව්‍යාප්තියත් සමඟ කාර්යාල කටයුතු අඩාල වීම මත හිඟ ආදායම් රැස් කිරීමේ කටයුතු තරමක් අඩාල වූ අතර, මේ වන විට අදාල ප්‍රාදේශිය කාර්යාල මගින් සහ නීති අංශය මගින් හිග ආදායම රැස් කිරීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී. මීට අමතරව හිඟ ගාස්තු අයකිරීම සම්බන්ධ නිර්දේශ ලබා | වර්ෂ ගණනාවක සිට හිඟව පවතින ආදායම් අයකර ගැනීම සඳහා අප්‍රමාදව කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | | ගැනීම සඳහා පත් කරන ලද හිග ආදායම් කමිටුව මගින් ලබා දී ඇති නිර්දේශ අනුව හිඟ ආදායම් රැස්කිරීම් කඩිනම් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී පසුගිය වර්ෂය අවසානයට පැවති රු.467,046,699 ක හිඟහිටි ආදායමෙන් රු.7,657,724 ක් හෙවත් සියයට 1.63 ක් පමණක් අයකර ගෙන තිබුණි. කල් ඉකුත් වී ඇති ආදායම් අයකර ගැනීම ඉතා පහළ මට්ටමක පැවතුණි. | රට තුළ පැවති කොවිඩ් වසංගත ව්‍යාප්තියත් සමඟ කාර්යාල කටයුතු අඩාල වීම මත හිඟ ආදායම් රැස් කිරීමේ කටයුතු තරමක් අඩාල වූ අතර, මේ වන විට අදාළ ප්‍රාදේශිය කාර්යාල මඟින් සහ නීති අංශය මඟින් හිඟ ආදායම් රැස් කිරීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී. | එම |
| (ඊ) | 2021 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය ව්‍යවසායන් 03 ක් විසින් එකතුව රු.252,075,609 ක තක්සේරු කිරීමේ ආදායම් හිඟහිටව පැවැත එමින් තිබුණි. එම හිඟ හිටි ආදායම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක **MF/DST – R/Val/MUD/**1 හා 2021.09.16 දිනැති ලිපිය මඟින් රජයේ සංවර්ධන සැලැස්මේ ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇති සෘජු ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දීමට නියමිත ඉඩම්, දේපළ වලට අදාල තක්සේරු සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියට අදාල හිඟ මුදල්, අදාල ඉඩම් බදු දීම සඳහා තෝරා ගනු ලබන ආයෝජකයා විසින් බදු වටිනාකමින් සියයට 25 ක් නාගරික සංවර්ධන අධිකාරියේ තැන්පත් කිරීමට හා තක්සේරු දිනයේ සිට වර්ෂය ඇතුළත පියවීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් අදාල හිඟ මුදල් වාර්තා කළ දිනයේ සිට | ආදායම් හිඟහිටව පවතින ආයතනය සමඟ සාකච්ඡා කර හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | වසරක් ඇතුළත අයකර ගැනීමට නියමිතව ඇත.<br>ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරිමේ සංස්ථාව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන ආයතන වල හිඟ ආදායම් අයකර ගැනීමට හිඟ ආදායම් කමිටුවේ නිර්දේශ ලබා දී ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට හා නීති උපදෙස් ලබා ගැනීමට මුදල් අමාත්‍යංශයේ අනුමැතිය සඳහා යැවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තුවේ මුළු හිඟහිටි ආදායමෙන් සියයට 69 ක් හෙවත් රු.478,092,636 ක් මහ කොළඹ පළාත් තක්සේරු කාර්යාලය විසින් එකතු කළ යුතුව තිබුණි. | මහ කොළඹ තක්සේරු කාර්යාලය මඟින් කිරුලපන, රාජගිරිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි තක්සේරු කටයුතු සිදුකරන අතර එම ප්‍රදේශයේ තක්සේරු වටිනාකම මෙන්ම තක්සේරු ගාස්තුද ඒ අනුව විශාල අගයක් ගනී. නාගරික සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරිමේ සංස්ථාව යන ආයතන සඳහා වන තක්සේරු කටයුතුද බොහෝ දුරට මහ කොළඹ පළාත් කාර්යාලය හරහා සිදුවන අතර,. ඉහත **(i)** කොටස මගින් දක්වා ඇති ආකාරයට හිග තක්සේරු ගාස්තු අයකිරීමට කටයුතු කරනු ලැබේ. | එම |

| | | |
|---|---|---|
| (ඩ) පළාත් කාර්යාල 11ක් විසින් වාර්තා කර තිබුණු රු.7,269,070ක හිඟහිටි ආදායම් 2021 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල හිඟහිටි ආදායම් වාර්තාවට ඇතුළත් කර නොතිබුණි. | අතපසුවීමකින් හිඟ තක්සේරු ගාස්තු සඳහා ඇතුළත් නොවූ රු.7,269,070/- ක මුදලක් ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී. | හිඟ හිට ඇති සියලු ආදායම් වාර්තා කිරීමට කටයුතු කළ යුතු වීම. |

**2.2 වියදම් කළමනාකරණය**

**--------------------------**

**2.2.1 ප්‍රතිපාදන නිෂ්ඵලවීම**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයන් තුනක් සඳහා රු.5,500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් කිසිදු උපයෝජනයක් නොකර ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි කර තිබුණි. | අයවැය චක්‍රලේඛය මගින් විදේශ ගමන් අත්හිටුවීම හේතුවෙන් විදේශ ගමන් වියදම් දැරීමට සිදු නොවූ අතර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය **ICTA** ආයතනය සමග සම්බන්ධ වී නවීකරණය කර ගැනීම 2106 වැය විෂය යටතේ ප්‍රතිපාදනය ඇතුළත් කර ඇතත් අදාල කටයුතු නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මීට අමතරව ආනයන සීමාවන් හා ණයවර ලිපි විවෘත කිරීමට අපහසු වීම මත 2509 වැය විෂයේ ප්‍රතිපාදන ඉතිරි විය. | මු.රෙ.50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව හා තාත්ත්විකව පිලියෙල කළ යුතු විම. |

### 2.2.2 අධිප්‍රතිපාදන සැලැසීම

------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයයන් 10 ක් සඳහා එකතුව රු.242,000,000 ක අධි ප්‍රතිපාදන සලසා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.82,953,301 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් එකතුව රු.159,046,699 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඒ අනුව එක් එක් වැය විෂයයට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 35 ක සිට සියයට 83 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | 2021 වර්ෂයට අදාළව සැලසුම් සකස්කොට , ඒ සඳහා වියදම් ඇස්තමේන්තු නිසි ආකාරව සකස් කරනු ලැබුවද කොවිඩ් තත්ත්වය මත වර්ෂයේ වැඩි කාලයක් කාර්යාල වසා තැබීම හෝ සීමිත නිලධාරීන් පිරිසකගෙන් ක්‍රියාත්මක කිරීමට සිදුවීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයන් බොහොමයක ප්‍රතිපාදන ඉතිරි විය. සැලසුම් කළ පරිදි බඳවා ගැනීම් සිදුනොවීම හේතුවෙන් 1001 හා 1003 වැය විෂයයන් වල ඉතිරිවීම සිදු වූ අතර, අයවැය චක්‍රලේඛ මගින් විදේශ ගමන් නතර කිරීමද සිදු විය. එමෙන්ම ආනයන සීමාවන් සහ බැංකු විසින් ණයවර ලිපි විවෘත නොකිරීම හේතුවෙන් පරිගණක මිලදී ගැනීමට නොහැකිවීම මූලධන ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු විය. | මු.රෙ.50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදි හා තාත්ත්වික ලෙස පිළියෙල කළ යුතු වීම. |

### 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය, සේවය අතහැර ගිය, විශ්‍රාම ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් | මුදල් රෙගුලාසි ප්‍රකාරව මෙම ණය ශේෂ අයකිරීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතින අතර, අයකිරීමට නොහැකි බව තහවුරු වූ ශේෂයන් කපා | දිගු කාලයක සිට හිඟව පවතින ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | රු.910,372 ක ණය ශේෂ හිඟහිටව පැවතුණි. එම ණය ශේෂයෙන් සියයට 36 ක් හෙවත් රු.328,720 ක් 1991 වර්ෂයේ සිට හිඟ හිටව පැවැත එමින් තිබුණි. | හැරීමට අදාළ කටයුතු සිදු වෙමින් පවතී. | |
| (ආ) | දෙපාර්තමේන්තුවේ පොත් අනුව හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට හිඟහිටි ණය ශේෂය රු. 93,219,454 ක් වි තිබුණත්, කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව හිඟහිටි ණය ශේෂය රු.93,150,056 ක් වී තිබුණි. ඒ අනුව රු.69,398 ක වෙනසක් අනාවරණය වි තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම වෙනස සසඳා නිවැරදි කිරිමට අපොහොසත් වී තිබුණි. | 2015 වර්ෂයේ ස්ථාන මාරු වී පැමිණි නිලධාරියෙකුගේ රු.71,024 ක ණය ශේෂය 2018 වර්ෂයේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් තක්සේරු දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් බී ගිණුමට හර කර ඇති නමුත් ස්ථාන මාරු වි පැමිණි නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ යටතේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ගිණුම් පොත්වල සටහන් නොවී තිබීම නිසා මෙම වෙනස ඇති වු අතර, එම වරද නිවැරදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවති. | වෙනස හඳුනාගෙන පොත්පත් නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දී ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස හඳුනාගත් වත්කම් අයිතම 96 ක් අපහරණය කිරීමට 2022 අප්‍රේල් මාසය වන විටත් කටයුතු කර නොතිබුණි. අපහරණය සඳහා හඳුනාගත් වත්කම්වල තක්සේරු වටිනාකම රු.18,400 ක් වී තිබුණත්, එම වත්කම්වල පොත් වටිනාකම හඳුනා ගෙන නොතිබුණි. | රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා භාණ්ඩ සමීක්ෂණ කටයුතු ප්‍රමාද වීම හා පළාත් කාර්යාල වෙතින් වාර්තා ප්‍රමාදවී ලැබීම හේතුවෙන් විගණනය සඳහා වාර්තා යැවීමට හා අපහරණ කටයුතු ප්‍රමාද විය. අපහරණයට අදාළ කටයුතු මේ වන විට අවසන් කොට ඇති අතර, වත්කම් වල පොත් අගය | වත්කම් අපහරණය කිරීම අප්‍රමාදව හා නිවැරදිව සිදු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබයි. වත්කම් අපහරණය කිරීමෙන් පසු පොත් වලින් ඉවත් කිරීමට පෙර සිගාස් වැඩසටහනේ වත්කම් මොඩියුලය යටතේ ගිණුම් ගත කළ වටිනාකම හදුනාගෙන ලෙජරයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලබයි. | |

**3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, චෙක්පත් අත්සන් කිරීමට බලය පවරන ලද නිලධාරීන් 05 දෙනෙකු ඇප තැන්පත් තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 අනුව ඇප තැබීම පිළිබඳව අමාත්‍යාංශයෙන් උපදෙස් විමසා ඇති අතර ලැබෙන උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කිරීම කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වීම. |

**4. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------------

**4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය**

---------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 515ක් හෙවත් සියයට 46ක් පුරප්පාඩුව පැවැතුණි. එම පුරප්පාඩුවලින් තනතුරු 263ක් හෙවත් සියයට 51ක් තෘතීයික මට්ටමේ තක්සේරු කාර්යයන් ඉටු කරන නිලධාරීන්ගේ තනතුරු වී තිබුණි. | අනුමත සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව බඳවා ගැනීම් සිදු කරන අතර, තක්සේරුකරු තනතුර සඳහා නිලධාරීන් 62 දෙනෙකු සේවා පළපුරුද්ද හා කුසලතාවය මත බඳවා ගැනීම් සිදු කර ඇත. තක්සේරුකරු තනතුර සඳහා සීමිත ධාරාව යටතේ බඳවා ගැනීමට අදාළව සකස් කරන ලද විභාග නිවේදනය, අනුමැතිය සඳහා | අත්‍යාවශ්‍ය තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට අප්‍රමාදව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. තවද සහකාර තක්සේරුකරුවන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය 2022.05.29 දින විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද අතර, එම විභාගයේ ප්‍රතිඵල මත ඉදිරියේ දී එම පුරප්පාඩු ද පිරවීමට නියමිතව ඇත. | |
| (ආ) | දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සහකාර තක්සේරු නිලධාරීන් වර්ෂ 8ක් පමණ කාලයක සිට දෙපාර්තමේන්තුවට බඳවා ගෙන නොතිබුණි. අවසන් වරට සහකාර තක්සේරු නිලධාරීන් 2013 වර්ෂයේ දී බඳවා ගෙන තිබුණි. | එම | එම |
| (ඇ) | තක්සේරු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වර්ෂ ගණනාවක් මුළුල්ලේ පැවැති අතර තක්සේරුකරණය සම්බන්ධව උපාධි සමඟ විශ්වවිද්‍යාලයෙන් පිටවන උපාධිධාරීන්ගෙන් මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | එම | එම |